# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.09.27 පැය 0630 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/1803/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

### 01. මනුෂ්‍ය ඝාතනයක් - වැලිකඩ පොලිස් වසම

2025.09.26 වන දින සවස් කාලයේ වැලිකඩ පොලිස් වසමේ අංගොඩ ප්‍රදේශයේදී පහරදීමක් හේතුවෙන් කාන්තාවක් මුල්ලේරියා රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට වැලිකඩ පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 65 ක් වූ අක්ගොන, අංගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

සිද්ධියට සම්බන්ධ සැකකරු අසල්වාසී පුද්ගලයෙකු වන අතර මරණකාරිය හා සැකකරු එකම ආයතනයක පිරිසිදු කිරීමේ රැකියාවක් සිදුකරමින් සිට ඇත. ඇති වූ ආරවුලක් හේතුවෙන් සැකකරු විසින් මරණකාරියගේ නිවසේදී ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදු කර ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය මුල්ලේරියාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සිද්ධියට සම්බන්ධ සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර වැලිකඩ පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - බුලත්සිංහල පොලිස් වසම.

2025.09.26 වන දින සවස් කාලයේ බුලත්සිංහල පොලිස් වසමේ මෝල්කාව බුලත්සිංහල මාර්ගයේ පාරුතල්විල ප්‍රදේශයේදී මෝල්කාව දෙසට ධාවනය වූ යතුරුපැදියක් ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි යතුරුපැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරුවන් දෙදෙනා බරපතල තුවාල ලබා බුලත්සිංහල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා හොරණ රෝහලට මාරුකර යැවීමෙන් පසු එක් පැදිකරුවෙකු මියගොස් ඇත. අනෙක් පැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලට මාරුකර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 26 ක් වූ පාරුතල්විල, බුලත්සිංහල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හොරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර . බුලත්සිංහල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - කොලොන්න පොලිස් වසම.

2025.09.26 වන දින අළුයම් කාලයේ කොලොන්න පොලිස් වසමේ අලිවාඩිය වලකඩ අතුරු මාර්ගයේ අලිවාඩිය ප්‍රදේශයේදී වලකඩ දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක තිරිංග ක්‍රියා විරහිත වී ඉදිරියට ඇදී ගොස් ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් රියදුරු හා පසුපස ගමන් කල කාන්තාවන් දෙදෙනෙකු බරපතල තුවාල ලබා කොලොන්න රෝහලට ඇතුලත් කිරීමේදී එක් කාන්තාවක් මියගොස් ඇති අතර අනෙක් කාන්තාව වැඩිදුර ප්‍රතිකාර සඳහා ඇඹිලිපිටිය රෝහලට මාරු කර යවා ඇත.

**මරණකාරිය වයස අවුරුදු 53 ක් වූ උල්ලිඳුවාව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු ඥාතීන්ට භාර දී ඇති අතර කොලොන්න පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - ලුණුගම්වෙහෙර පොලිස් වසම.

2025.09.26 වන දින උදෑසන කාලයේ ලුණුගම්වෙහෙර පොලිස් වසමේ මොණරාගල මාතර මාර්ගයේ 70 පාර හන්දිය අසලදී ලුණුගම්වෙහෙර දෙසට ධාවනය වූ බස් රථයක් යතුරුපැදියකට ඉස්සර කිරීමට යාමේදී එම යතුරුපැදියේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා තණමල්විල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා හම්බන්තොට රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 50 ක් වූ තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු ඥාතීන්ට භාර දී ඇත. අනතුරට සම්බන්ධ බස් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ලුණුගම්වෙහෙර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - බොරැල්ල පොලිස් වසම.

2025.09.26 වන දින උදෑසන කාලයේ බොරැල්ල පොලිස් වසමේ බේස්ලයින් මාර්ගයේ බන්ධනාගාර හන්දිය අසලදී දෙමටගොඩ දෙසට ධාවනය වූ කන්ටේනර් රථයක් යතුරුපැදියකට ඉස්සර කිරීමට යාමේදී එම යතුරුපැදියේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 25 ක් වූ මස්කෙළිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු ඥාතීන්ට භාර දී ඇත. අනතුරට සම්බන්ධ කන්ටේනර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර බොරැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - හබරාදූව පොලිස් වසම.

2025.09.26 වන දින දහවල් කාලයේ හබරාදූව පොලිස් වසමේ ගාල්ල මාතර මාර්ගයේ කතළුව පාලම අසලදී මාතර දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකි වී මාර්ගයේ වම් පස නවතා තිබූ කන්ටේනර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ රියදුරු සහ පසුපස අසුනේ ගමන් කළ කාන්තාවක් බරපතල තුවාල ලබා කරාපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී කාන්තාව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 70 ක් වූ අහංගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර හබරාදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - හම්බේගමුව පොලිස් වසම.

2025.09.26 වන දින රාත්‍රි කාලයේ හම්බේගමුව පොලිස් වසමේ හම්බේගමුව වෙළිඔය මාර්ගයේ මළකදුර හන්දිය අසලදී මළකදුර දෙස සිට මහපැලැස්ස දෙසට ධාවනය වූ යතුරුපැදියක් ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි ට්‍රැක්ටර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා ඇඹිලිපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 23 ක් වූ බලංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඇඹිලිපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ ට්‍රැක්ටර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර හම්බේගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**